# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 14,906 — 1970 මැයි 15 වැනි සිකුරාද — 1970.5.15**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... .. ... | 373 | ආදයම හා වියදම පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 373 | අය-වැය ලේඛන ... ... ... | 379 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 378 | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 378 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දන්වීම ... | — | විවිධ දන්වීම ... ... ... ... | 382 |


## පළාත් පාලන නිවේදන

එල්. ඩී.—බී. 58/35.

### නාවලපිටිය නගර සභාව

**නගරසභා ආඥපනත**

### 1970 වර්ෂය සඳහා ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥපනතේ 130 (ආ) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි සීමාකිරීම්වලට හා නිදහස් කිරීම්වලට යටත්ව පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන පරිදි නාවලපිටිය නගරය තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට 4 ක් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් නාවලපිටිය නගර සභාව විසින් 1970 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.4.25 වැනි දින,
කොළඹ දීය.

5–195—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරු කරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4ක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත් වන්නන්ට නියම කළ හැකිය

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත් වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුර වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්‍ය්‍ය සඳහාත් විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස '' නව ප්‍රවේශක නිලධාරීන්ටත් '' නියම කරනු ලැබේ.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබේ.

(ආ) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී පත්වීම් ස්ථිර කිරීම අනිකුත් කරුණු අතර, නියමිත කාල සීමාවන් තුළදී සිංහලය පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමාවන් තුළදී මේ ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමිය හැකි වන අතර, නියමිත කාලසීමාවෙන් පසු වැඩිපුර කාලසීමාවක් ඇතුලතදී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වැඩිවීම තාවකාලිකව කල් දැමීම, වැටුප් වැඩිවීම නතර කිරීමක් බවට පරිවර්තනය කරනු ලැබේ. එසේ නතර කිරීම පරීක්ෂණයෙන් සමත් වනතුරු බලපවත්වනු ඇත. (අංක 13,387 සහ 62.11.9 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලන්න).

(ඇ) **අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථය අවම සුදුසුකම් වශයෙන් නියම කොට ඇත්තාවූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයකින් සම්මානයක් තිබිය යුතුය.

1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්වවූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියාවූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාළ නොවේ.

(ඈ) **කාර්යක්ෂමතා කඩයිම.**—පත්වීම ස්ථිර කරන ලද දිනයේ සිට අවුරුදු 2ක් ඇතුළතදී ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ සිංහල භාෂාව පිළිබඳ කාර්‍ය්‍යක්ෂමතා කඩයිම් පරීක්ෂණයකින් සමත් වන ලෙස නව ප්‍රවේශක නිලධාරීන්ට නියම කරනු ලැබිය හැකිය. මේ පරීක්ෂණයෙන් සමත්වීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලය වනුයේ වැටුප් වැඩිවීම කල් දැමීමය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබා ගන්නා '' නව ප්‍රවේශක නිලධාරීහු '' සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

(v) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී සිංහල ප්‍රවීණතාව පිළිබඳ නියමිත තත්ත්වයට පැමිණිය නොහැකි වුවහොත් අංක 21 සහ 22 දරණ පළාත් පාලන සේවා රෙගුලාසිවල සාමාන්‍ය විධිවිධාන බලපවත්වනු ඇත.

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරණ කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් '' නව ප්‍රවේශක නිලධාරි '' යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන්ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ '' ආදි ප්‍රවේශක නිලධාරීන් '' කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදාළ නොවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා '' ලාංකික '' යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්තවූ අයදුම්කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අවම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදානම්ව සිටිත්ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම් පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කායර්‍යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම් පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වන තුරු ස්වකීය අයදුම් පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ.යු.–(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු **කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්** වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙලකිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම් කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්වලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රිසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡෙදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

**————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පූරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය:————.

(ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.

ජාතිය :————.

(එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳුහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස අවුරුදු :————. මාස :————, දින :————

(ආ) උපන් දිනය :————

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතනය හා කාලසීමාවන් :————

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රෙණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශෙෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරද කරුකරනු ලැබුවේද? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද?:————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වූවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### ගෘහ නිර්මාන ශිල්පි තනතුර—නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි. තෝරා ගනු ලැබෙන අපේක්ෂකයා, පළමු වරට කොළඹ නගර සභාවට පත් කරනු ලැබේ.

2. වැටුප් පරිමානය.—මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය වසරකට රු. 8,160—8×360+11×480—රු. 16,320 කි. මෙම වැටුප් පරිමානයෙහි වසරකට රු. 11,040 සහ රු. 14,880ට මත්තෙන් කාර්යක්ෂමතා කඩයිම් වේ. සුදුසුකම් හා පළපුරුද්ද අනුව, සුදුසු අපේක්ෂකයා මෙම වැටුප් පරිමාණයෙහි පියවරක තැබීමට පිළිවන. රජයේ නිලධාරින්ට අදාල කොන්දේසි හා ප්‍රමාණයන් අනුව විවාහක දීමනාවක් ද, විවාහක නිලධාරින්ට ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස : 1970.6.2 දිනට වයස අවුරුදු 50 නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන්ට, බ්‍රිතාන්‍ය ගෘහනිර්මාණ ශිල්පීන්ගේ රාජකීය ආයතනයේ සංගමික සාමාජිකත්වයක් හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් තිබිය යුතුයි.

4. මෙම ගැසට් පත්‍රයේ IV වන කොටසේ ආරම්භයෙහි පළ කර ඇති පළාත් පාලන සේවයෙහි තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි බලනු මැනවි.

5. පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 1970.6.2 දිනට පෙර පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස් හෝ සභාපතිවරයා ගේ වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ ඊට පෙර භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසු අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලද බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 29 දින,
තැ. පෙ. 530,
කොළඹ.

5–355—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### ආහාර පරීක්ෂක තනතුර

පළාත් පාලන සේවයේ ආහාර පරීක්ෂක තනතුරක් සඳහා පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගෙන් පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම්පත් කැඳවයි.

2. ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—වර්ෂයකට රුපියල් 5,736—144×6—180×8 සහ 240×6—රු. 9,480.

නිල ඇඳුම් නොමිලයේ සපයනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්.—ඉල්ලුම්කරුවන් මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂා ආයතනයේ (එංගලන්ත) සහතිකය ලැබ තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, 1970.6.2 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නාමට නොවේ. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 11 වැනි සහ 17 වැනි ශීර්ෂ වෙනුවට පහත සඳහන් කොට ඇති ශීර්ෂ යොදා ගත යුතුය :—

"11. (ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂා ආයතනයේ සහතිකය ලබා ගත් දිනය :————.

(ii) දීමනා හැර, දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය: ————.

(iii) පළාත් පාලන ආයතනවල හෝ රජය යටතේ සේවා කාලය පිළිබඳ සටහන්, දරණ ලද තනතුරු හා කාල සීමාවන් :————.

17. අත් සරින්න."

6. අයදුම්පත් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නො ලැබේ. අවසාන දින වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම ඒ අවදානමට මුහුණ පාති.

7. නියමිත දිනට පසුව රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානියා වෙත ලැබී ඇති බවට සහතික කර ප්‍රමාදය පිළිගත හැකි හේතු දක්වමින්, ඒ අයදුම්පත්‍ර පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සලකා බලනු නො ලැබේ.

8. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක් ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1970 මැයි මස 2 වැනි දින,
තැ. පෙ. 530,
කොළඹ.

5–356—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### සංඛ්‍යා ලේඛනඥ තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. **වැටුප් පරිමාණය.**—තනතුරට අදාළ ඒකාබද්ධ වැටුප් පරිමාණය වර්ෂයකට රු. 6,720—360×12—480×11—රු. 16,320 යනුවෙනි. එහි රු. 11,520 හා රු. 14,880 යන වාර්ෂික වැටුප්වලට පෙර කාර්යක්‍ෂමතා කඩඉම් වේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—පහත සඳහන් කරුණු සනාථ කිරීමට අයදුම් කරුවන් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළයුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1970.6.2 දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව, (පළාත් පාලන සේවා නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පහත සඳහන් විෂයයන් එකකින්, පළමුවන හෝ දෙවන පෙළ ගෞරව උපාධියක් හෝ පශ්චාත් උපාධියක් හෝ ලබා තිබීම. සංඛ්‍යාලේඛන ගණිතය, අර්ථශාස්ත්‍රය, ප්‍රජා විද්‍යාව, සමාජ විද්‍යාව හෝ මානව විද්‍යාව.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලන්න.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත 1970.6.2 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාර ගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර ප්‍රමාදයට හේතුවූ පිළිගතහැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය,
1970 අප්‍රියෙල් මස 29 දින.

5–357—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### I වැනි ශ්‍රේණියේ වැද්දුම්කරු (ජලකර්මාන්ත) තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. තෝරාගනු ලබන අයදුම්කරු පළමුවරට මහනුවර නාගරික සභාවට පත් කරනු ලැබේ. ඔහු මාරු වීමට යටත් වන අතර දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුය.

3. **තනතුරට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රු. 3,120—60×14—රු. 3,960 වර්ෂයකට රු. 3,480 යන වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත. රජයේ නිලධාරීන්ට අදාළ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව විවාහක දීමනාවක්ද, විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

4. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) 1970.6.2 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය. (මෙම වයස් සීමාව පළාත් පාලන සේවයේ සාමාජිකයින්ට සහ සභා සේවකයින්ට අදාළ නොවේ.)

(ආ) ජීයම්, ටයිටන් හා යාන්ත්‍රික පූට්ටු සහිත 3"—25" දක්වා වූ විෂ්කම්භයක් ඇති චීනච්චට්ටි පයිප්ප ඇමීම, වැල්ව්, ගිනි නිවන ජල නළ, වායු වැල්ව්, රිෆ්ලෙක්ස් වැල්ව් සහ බොන වතුර, පයිප්පවල ස්ථාවය කණු ආදී විශේෂ වාත්තු සවිකිරීම හා අළුත්වැඩියා කිරීම, එසේම පී. වී. සී. සවිකිරීම් සහිත පී. වී. සී. පයිප්ප ඇමීම යනාදිය පිළිබඳව ප්‍රාදේශීය බලමණ්ඩලයක, රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක යටත්පිරිසෙයින් අවුරුදු දහයක පළපුරුද්දක් තිබිය යුතුය. (සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.)

සුදුසුකම් ලබන අයදුම්කරුවන්ට ප්‍රායෝගික පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු විය හැකිය.

5. මේ ගැසට් පත්‍රයේ ආරම්භයෙහි පළ කර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙළ කොට, 1970.6.2 වැනි දිනට හෝ ඊට පළමු මා වෙත ලැබෙන ලෙස එවිය යුතුය.

7. අයදුම්පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ 1 යන ලිපිනයට මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ.

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන ආයතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දිනට පෙර ලැබුණු බැව් සහතික කර, ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින් ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ අයදුම්පත් පමණක් ලැබුණු බැව් දන්වනු ලැබේ.

සී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 අප්‍රේල් මස 29 දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

5-358—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—බින්තැන්න උතුර ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩඉම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) **වයස.**—1970 මැයි මස 31 වැනි දිනට වයස අවුරුදු 20 ට නො අඩු 30 නො වැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත්ව සිටිය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර, ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1970 මැයි මස 31 වැනි දිනට හෝ ඊට පළමු බින්තැන්න උතුර ගම් සභාවේ සභාපති වෙත ලැබෙන්ට එවිය යුතුයි.

ජේ. සී. අප්පුහාමි,
බින්තැන්න උතුර ගම්සභාවේ සභාපති.

1970 මැයි මස 2 දින,
බින්තැන්න උතුර ගම්සභා කාර්යාලයේ දිය.
මහඔය.

5–257—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

**කම්බිකරු සහායක තනතුර—වැලිසර සුළු නගර සභාව**

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් 1970 මැයි මස 30 දින සවස 3 තෙක් මවිසින් භාරගනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 504—30×8—රු. 744 දක්වා.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස අවුරුදු 18ත් 35 අතර විය යුතුයි.

(ආ) අයදුම් කරුවන් අඩු වශයෙන් සිංහල 7 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුයි.

(ඇ) අයදුම් කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි දැමීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණකර ඇති අය විය යුත්තාහ.

නැතහොත්

(ඈ) අයදුම් කරුවෝ පළාත් පාලන ආයතනයක, ආණ්ඩුවේ ආයතනයක හෝ සංස්ථාවක විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු 10ක පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි. ඉහත (ඇ) කොටසේ සඳහන් සහතික ලබාගත් පසු නගර විදුලි ආලෝක ව්‍යාපාරයන්හි යටත් පිරිසෙයින් අවුරුදු දෙකක පළපුරුද්දක් ඇති අය කෙරෙහි වැඩි සැලකිලි දක්වනු ලැබේ.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරු වලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට ඉහත සඳහන් දිනට සහ වේලාවට මා වෙත ලැබෙන්නට එවිය යුතුය.

ඇන්ටන් අමරසේකර,
සභාපති,
වැලිසර සුළු නගර සභාව.

1970 අප්‍රේල් මස 23 දින,
වැලිසර සුළු නගර සභා කාර්යාලයේ දීය.

5–368—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

**මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පවත්වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1969.10.2**

ඉහත විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයින් සමත් වී ඇත :—

(1) අල්මේද ටී. සී.—කොළඹ නාගරික සභාව.

(2) ද සිල්වා පී. වී. ජී—වත්තල පළාත් ආණ්ඩු සභාව.

(3) මයිලැව ආර්. බී.—මාතලේ නාගරික සභාව.

(4) විමලසිරි ඩබ්. ඩී. ටී. —නුවරඑළිය නගර සභාව.

ඩී. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 මැයි මස 6 දින,
තැ. පෙ. 530, කොළඹ.

5–364—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

**V ශ්‍රේණියේ ලේකම්වරුන් බඳවා ගැනීමේ විභාගය—1969.9.17**

ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂකයින් V ශ්‍රේණියේ ලේකම්වරුන් වශයෙන් පත් කිරීමට තෝරා ගන්නා ලදී :—

1. පියරත්න ඩී. වී., දෙ. කෝ. මෙගොඩපොතපත්තු ග. ස.

2. විජේසිංහ එම්. ටී. පී., හොර., ප. ආ. ස.

3. අබේවර්ධන ඩබ්. එස්. බී., කොළඹ න. ස.

4. රණවක ඩබ්., කුලියාපිටිය න. ස.

5. සිවපාතසුන්දරම් ඒ., කල්මුනේ සු. න. ස.

ඩී. විජේසිංහ,
ප. පා. සේ. කො. ස./ලේකම්.

1970 මැයි මස 6 දින,
තැ. පෙ. 530,
කොළඹ.

5–363—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

## අම්බලන්ගොඩ නගර සභාව

**නගර සභා ආඥාපනත**

**(255 වැනි අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 153 වැනි හා** 157 වැනි වගන්ති යටතේ අම්බලන්ගොඩ නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 154 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ගරු පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 අප්‍රේල් 19 වැනි දින,
කොළඹ දී ය.

### කුරුඳු දුම් ගැස්සීමට සම්බන්ධ අතුරු ව්‍යවස්ථා

1. නගර සභාවේ සභාපති විසින් ඒ සඳහා නිකුත් කරනු ලද බලපත්‍රයක් නොමැති කිසිම තැනැත්තකු විසින් අම්බලන්ගොඩ නගර ප්‍රදේශය තුළ පිහිටි යම් ගොඩනැගිල්ලක කුරුඳු දුම් ගැස්සවීමේ කර්මාන්තය නොකළ යුතුය.

2. 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කෙරෙන සෑම බලපත්‍රයක්ම 15 වෙනි අතුරු ව්‍යවස්ථාව යටතේ කලින් අවලංගු නොකරනු ලැබුවහොත් එය නිකුත් කිරීමට විෂයවූ අවුරුද්දේ දෙසැම්බර් මස 31 වැනි දින අවලංගු වේ.

3. (1) තත්කාර්ය සඳහා පාවිච්චි කළ යුතු ගොඩනැගිල්ල ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඔහු බලය පැවරූ යම් තැනැත්තකු විසින් අනුමත කරනු නොලැබුවහොත්, 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ කිසිම බලපත්‍රයක් නිකුත් නොකළ යුතුය.

(2) කුරුඳු දුම් ගැස්සවීමේ කාර්ය සඳහා පාවිච්චි කළ යුතු කාමරය හෝ කාමර පහත සඳහන් කොන්දේසිවලට අනුකූල නොවූවහොත් ඒ කිසිම ගොඩනැගිල්ලක් අනුමත නොකළ යුතුය.

(අ) ඒ සෑම කාමරයකම බිත්ති උසින් අඩි 9 කට අඩු නොවිය යුතු අතර ඒවා ගඩොලින්, ගලින් හෝ කබුක් ගලින් බැඳ ඒවායේ ඇතුළත මතුපිට සහ මුලින්ම යටලිය දක්වා සිමෙන්තියෙන් කපරාරු කළ යුතුය. නැතහොත් පසාරු නොවන වෙනත් ද්‍රව්‍යවලින් නිම කළ යුතුය.

(ආ) බිම සිමෙන්තියෙන් නැතහොත් පසාරු නොවන වෙනත් ද්‍රව්‍ය වලින් තැනවිය යුතුය.

(ඇ) වායු දුමාර හෝ දුම් හෝ වෙනත් අන්තරාදායක ද්‍රව්‍ය වහලින් හෝ වහලටත් යටලිවලටත් අතර වූ යම් ඉඩ කඩින් තකින් පිටවීම් වළක්වා ලනු පිණිස වහල සිමෙන්තියෙන්, කොන්ක්‍රීට්වලින් හෝ වෙනත් ස්ථිර ද්‍රව්‍යයකින් සෑදිය යුතුය.

(ඇ) කාමරයේ හෝ කාමරවල වහල මැදින් හෝ සභාපති විසින් නිර්ණය කළ හැකි වෙනත් තැනකින් දුම් පිටාරයක් හෝ චිමිනියක් තැනවිය යුතුය. ඒ දුම් පිටාරයේ හෝ චිමිනියේ විෂ්කම්භය අඟල් 6 කට අඩු නොවිය යුතු අතර උසින් පොළොවේ සිට අඩි 60 කට අඩු නොවිය යුතුය.

(ඈ) සෑම කාමරයකම දොර හෝ දොරවල් වැසූ විට සුළං නොවදින සේ හොඳාකාර හේත්තුවන ලෑලිවලින් හෝ පසාරු නොවන වෙනත් ද්‍රව්‍ය වලින් ඒවා තැනිය යුතුය.

(ඉ) ගොඩනැගිල්ලට සෑහෙන ප්‍රමාණ කසළ කාණු සෑදිය යුතුය.

(ඊ) ගොඩනැගිල්ලේ සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා සෑම සේවකයින් 10 දෙනකුට එක් වැසිකිළිය බැගින් තිබිය යුතුය.

(උ) දුම්ගැසීමේ කටයුතු වල නිරතවූ සේවකයන්ගේ සේදිලි සහ නෑම සඳහා සෑහෙන පමණ පහසුකම් ගොඩනැගිල්ලෙහිම සම්පාදනය කළ යුතුය.

(එ) ගොඩනැගිල්ල ජනවාසයෙන් තොර ප්‍රදේශයක පිහිටුවිය යුතු ය.

(ඒ) ගොඩනැගිල්ල මනුෂ්‍ය වාසස්ථානයකසිට යටත් පිරිසෙයින් යාර සියයක්වත් ඈතින් පිහිටා තිබිය යුතුය.

4. දුම්ගැස්සීමේ කටයුතුවල නිරත සියලුම සේවකයන් විෂ වායු, දූමාර හෝ දුම් ආශ්වාස කිරීමෙන් වලක්වාලීම සඳහා ඔවුනට යෝග්‍ය ගෑස් මුහුණු සහ ඇස්වලට ඇතිවිය හැකි යම් උපද්‍රව වලක්වාලීම සඳහා ඇස් ආවරණ ද සැපයිය යුතුය.

5. දුම්ගැස්සීමේ නිරත සියලුම සේවකයින් එයින් උද්ගත වන සියලුම උපද්‍රව විෂයෙහිලා රක්ෂණය කළ යුතු අතර සාක්ෂි, බලපත්‍රයක් සඳහා එවනු ලබන ඉල්ලුම් පත්‍රය සමඟ සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

6. සෑම බලපත්‍රකාරයෙකුම තම ගොඩනැගිල්ලේ පිට පැත්තේ ප්‍රකට ස්ථානයක තමාගේ නම, සහ "අප්‍රසන්න කර්මාන්ත බලපත්‍රකරු" යන වචන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම කියවිය හැකි වනසේ පින්තාරු කළ පුවරුවක් සවිකොට තැබිය යුතුය.

7. සෑම බලපත්‍රකරුවකුම, මෙම අතුරු ව්‍යවස්ථාවල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පිටපතක් හා තමාට ලැබී ඇති බලපත්‍රය රාමු කරවා බලපත්‍ර ලත් ගොඩනැගිල්ලේ ප්‍රකට ස්ථානයක තැබවිය යුතු අතර සියලුම සේවකයන්ගේ නම් හා ලිපිනය දැක්වෙන ලැයිස්තුවක් සභාපති විසින් හෝ ඔහු බලය පැවරූ යම් තැනැත්තකු විසින් සියලුම සාධාරණ වේලාවන්හිදී පරීක්ෂා කළ හැකිවනසේ ගොඩනැගිල්ලෙහි තැබීමට සැලැස්විය යුතුය.

8. කුරුඳු දුම් ගැස්සීම සඳහා බලපත්‍රයක් දරන සෑම තැනැත්තකුම ඒ කාර්යයට අවශ්‍ය සියලුම ද්‍රව්‍ය මහජනයාට යම් පීඩාවක් නොවන සේ ගබඩා කළ යුතුය.

9. කුරුඳු දුම් ගැස්සීම සඳහා බලපත්‍රයක් දරන සෑම තැනැත්තකුම කුණු, අළු, රොඩු සහ සූරා දැමූ ද්‍රව්‍ය ඉවත ලන ද්‍රව්‍යයන්ද සමඟ දිනපතා ගොඩනැගිල්ලෙන් ඉවත් කරවා යම් පීඩාවක් නොවන ආකාරයකින් ඊට සුදුස්සක් කරවිය යුතුය.

10. කුරුඳු දුම් ගැස්සීම සඳහා බලපත්‍රයක් දරන කිසිම තැනැත්තකු විසින් කර්මාන්තයට සම්බන්ධ යම් ද්‍රව්‍ය, අතුරු නිෂ්පාදන හෝ ඉවත ලන ද්‍රව්‍ය මගින් හෝ කර්මාන්ත සම්බන්ධයෙන් සේවයෙහි යොදන ලද යම් තැනැත්තන් විසින් යම් ගඟක්, දිය ධාරාවක්, ඇළක්, දොළක්, ළිඳක්, වැවක් හෝ ආවරණ රහිත යම් දිය කඩිත්තක් අපවිත්‍ර කිරීමට ඉඩ නොහැරිය යුතුය.

11. සෑම බලපත්‍රකරුවකුම ගොඩනැගිල්ලේ බිම දිනපතා ශුද්ධ පවිත්‍ර කරවිය යුතුය.

12. සෑම බලපත්‍රකරුවකුම ගොඩනැගිල්ලේ කාණු සියල්ලම මනා තත්ත්වයෙන් පවත්වා ගෙන යාමු හා දිනපතා පවිත්‍රව තබා ගැනීම කරවිය යුතුය.

13. සෑම බලපත්‍රකරුවකුම බිම, බිත්ති, වහල, දොරවල් හා ජනේල සහ සෑම දුම් පිටාරයක් හෝ චිමිනියක් ද සේවකයන්ට යම් අනතුරක් හෝ මහජනයාට යම් පීඩාවක් සිදුවීම වැළැක්වෙන සේ මනා තත්ත්වයකින් හා හොඳ පිළිවෙළින් පවත්වාගෙන යා යුතුය.

14. කිසිම බලපත්‍රකරුවකු පෙ. ව. 4 හා ප. ව. 9 අතර පැය ගණන තුළ දුම් ගැස්සීමේ කටයුතු කිසිවක් නොකළ යුතුය.

15. සභාපති විසින්, හෝ ඔහු ඒ සඳහා සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පැවරූ සභාවේ යම් නිලධරයකු විසින් සියලුම සාධාරණ වේලාවන්හිදී හෝ කුරුඳු දුම් ගස්වන යම් ගොඩනැගිල්ලකට ඇතුළුව එය පරීක්ෂා කිරීම නීත්‍යානුකූල විය යුතු අතර බලපත්‍රකරු හෝ ස්ථානය භාරව සිටින තැනැත්තා ඒ පරීක්ෂණයට ඉඩ දිය යුතුය.

16. කුරුඳු දුම් ගැස්සවීමට සම්බන්ධ මේ අතුරු ව්‍යවස්ථාවලින් යමක් කඩ කෙරෙන සෑම අවස්ථාවකදීම රුපියල් දෙසිය පනහකට වැඩි නොවන දඩයකින් දඬුවම් ලැබිය යුතු අතර වරදකරු කරනු ලැබීමෙන් පසු හෝ ඒ කඩ කිරීම ගැන සිහිපත් කරවා සභාපති විසින් හෝ ඔහු බලය පැවරූ නිලධාරියකු විසින් ලිඛිත නිවේදනයක් භාර දීමෙන් පසු ඒ කඩ කිරීම තවදුරටත් කරගෙන ගිය අවස්ථාවක ඒ එක් එක් දවසට රුපියල් විස්සකට නොවැඩි අතිරේක දඩයකින්ද දඬුවම් ලැබිය යුතුය.

17. කුරුඳු දුම් ගැස්සීමට සම්බන්ධ මෙම අතුරු ව්‍යවස්ථාවලින් යමක් කඩ කිරීම සම්බන්ධයෙන් නියම කළ හැකි වෙනයම් දඬුවමකට අතිරේකව, නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් දෙවරක් හෝ ඊට වැඩි වාර ගණනක් වරදකරු කරනු ලැබූ බලපත්‍රකරුවකුගේ බලපත්‍රය අවලංගු කිරීම නීත්‍යානුකූල විය යුතු අතර අවලංගු කිරීම සම්බන්ධයෙන් බලපත්‍රකරු කිසියම් වන්දියක් ලැබීමට හිමිකම් නොලැබිය යුතුය.

18. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"කුරුඳු දුම් ගැස්සීම" යන්නෙන්, වේලා පදම් කළ කුරුඳුවලට ගෙන් දගම් දුම් ගැස්සීමේ ක්‍රියාවලිය අදහස් කෙරේ.

5–369—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## අය - වැය ලේඛන

### පස්සර සුළු නගර සභාව

**1970 වර්ෂයේ 2 වෙනි පරිපූරක අය වැය ලේඛනය**

(සාමාන්‍ය අය වැය—1 කොටස)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඩී.5 (සී) | ජල සැපයීම නඩත්තුව සඳහා | ... | රු. | 2,000 | 0 | යෝජනා 4/19.3.70 |
| සී. 4 | කාර්යාල ඉඩම් හා ගොඩනැගිලි | ... | රු. | 500 | 0 | යෝජනා 1(ආ)/8.4.70 |
| ඩී.3(ඇ/ජ) | වැසිකිළි සඳහා ඉඩම් ලබාගැනීම | ... | රු. | 1,000 | 0 | යෝජනා 3(4)/22.4.70 |
| | | | | 3,500 | 0 | |

ඉහත සඳහන් අතිරේක වැය ශීර්ෂ ඒ ඒ කාරණයන් ඉදිරියෙන් සඳහන්කර ඇති යෝජනා අනුව සභා සම්මතවූ බව මෙයින් සහතික කරමි.

ඇම්. එච්. ඇම්. රෂීම්,
සභාපති,
පස්සර සුළු නගර සභාව.

1970 අප්‍රේල් මස 24 දින,
පස්සර සුළු නගර සභා කාර්යාලයේදීය.

5–213—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## වලස්මුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40 (2) යටතේ ඉල්ලීම

### 1970 අය–වැය ලේඛනය

වර්ෂ 1970 අය වැය ලේඛනයේ මුදල් ඉතිරි වේ යයි ගණන් බලා ඇති වැය ශීර්ෂයන්ගෙන් වැය ඉක්මවා යන ශීර්ෂයන්ට මෙහි පහත දක්වා ඇති පරිදි මුදල් මාරු කිරීමට 1970 මාර්තු මස 24 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී අංක 6 දරන යෝජනාවෙන් සභා සම්මත කර ගන්නා ලදී.

**ඉතිරි**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ1 (ජී) | ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 6,750 | 0 |
| ඒ1 (එච්) | අතිරේක දීමනා ... ... | 1,860 | 0 |
| බී13 | ජීවනාධාර හා වි. ජීවනාධාර ... ... | 725 | 0 |
| සී1 | වේතන ... ... ... | 500 | 0 |
| සී9 | ඉඩම් අත්පත් කර ගැනීම ... ... | 250 | 0 |
| ඩී1 (ඇන්) | මාතෘ දරකාභිවෘද්ධි මධ්‍ය ස්ථානය ... | 553 | 0 |
| ඩී2 (ජී) | අකුරු දීමනා ... ... | 2,520 | 0 |
| ඩී2 (ඊ) | ජීවනාධාර හා වි. ජීවනාධාර ... ... | 5,685 | 0 |
| ඩී3 (අයි) | අකුරු දීමනා ... ... | 672 | 0 |
| ඩී4 (සී) | ඉඩම් සතුකර ගැනීම ... ... | 150 | 0 |
| ඩී5 (ඩී) | ඉඩම් සතුවට ගැනීම ... ... | 100 | 0 |
| ඩී7 (ඩී) | ඉදිකිරීම ... ... ... | 2,500 | 0 |
| ඩී7 (එෆ්) | ඉඩම් සතුකර ගැනීම ... ... | 200 | 0 |
| ඊ4 | සතුකර ගැනීම ... ... | 200 | 0 |
| | | 22,665 | 0 |

**වැඩිපුර වියදම්**

| | | රු. | ශ. |
|---|---|---|---|
| ඒ1 (ඒ) | ලේකම් ... ... | 2,700 | 0 |
| ඒ1 (බී) | ලිපිකරුවෝ ... ... | 4,600 | 0 |
| ඒ1 (සී) | ආදායම් පරීක්ෂක ... ... | 1,070 | 0 |
| ඒ1 (එෆ්) | විශ්‍රාම වැටුප් ... ... | 250 | 0 |
| ඒ2 (ඒ) | දීමනා ... ... ... | 400 | 0 |
| බී1 (බී) | ඕවර්සියර්වරු ... ... | 1,070 | 0 |
| බී14 | බස් නැවතුම් පොල හා බස් නවත්වන ස්ථාන ... | 200 | 0 |
| ඩී1 (එච්) | කාණු ඉදිකිරීම ... ... | 400 | 0 |
| ඩී2 (ඒ) | දෛනික වැටුප් ... ... | 9,200 | 0 |
| ඩී2 (සී) | උපකරණ ... ... | 500 | 0 |
| ඩී3 (ඒ) | දෛනික වැටුප් ... ... | 1,775 | 0 |
| ඩී4 (බී) | නඩත්තු කිරීම ... ... | 150 | 0 |
| ඩී7 (බී) | නඩත්තු කිරීම ... ... | 350 | 0 |
| | | 22,665 | 0 |

ජී. ඇම්. ඇෆ්. ද සිල්වා,
සභාපති,
වලස්මුල්ල සුළු නගර සභාව.

1970 අප්‍රියෙල් 25 ද,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේදීය.

අනුමත කරමි.

1970 අප්‍රියෙල් මස 30 දින,
හම්බන්තොට පලාත් පාලන කාර්යාලයය.

හම්බන්තොට පලාත් පාලන සහකාර කොමසාරිස්.

5–214—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## රුවන්වැල්ල සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(ii) යටතේ කෙරෙණ අයදුම් පත්‍රය.

### 1970 අය-වැය ලේඛනය—1 කොටස—සාමාන්‍ය

1970 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන්කරණ ලද මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත සඳහන් වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍යව් තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදවීමට, 1970ක්වූ මාර්තු මස 28 වෙනි දින පවත්වන ලද රුවන්වැල්ල සුළු නගර සභාවේ මාසික රැස්වීමේදී යෝජනා අංක 4 (viii) දරණ යෝජනාවෙන්, පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව, සභා සම්මත විය.

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| **ඒ.—පොදු වියදම් :** | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 2,753 | 0 |
| (බී) ලිපිකරු මණ්ඩලය ... ... | 4,040 | 0 |
| (සී) ආදායම් පරීක්ෂක ... ... | 1,786 | 0 |
| (ඩී) කාර්යාල කාර්ය සහායක ... ... | 1,784 | 0 |
| 2. සංස්ථා වියදම්— | | |
| (බී) ගමන් ගාස්තු ... ... | 950 | 0 |
| (සී) අයකැමි කම්වූ මිළ ... ... | 200 | 0 |
| (එච්) ගණකාධිකාරී ගාස්තු ... ... | 1,000 | 0 |
| (කේ) කාර්යාලීය භාණ්ඩ හා උපකරණ ... | 5,000 | 0 |
| **බී.—මංමාවත් :** | | |
| 7. අත්පත්කර ගැනීම් ... ... ... | 4,000 | 0 |
| **සී.—නගර හා ඉඩම් ගොඩනැගිලි :** | | |
| 1. වේතන ... ... ... | 1,516 | 0 |
| 3. කාර්යාල කුලී ... ... ... | 300 | 0 |
| 4. නඩත්තුව ... ... ... | 1,500 | 0 |
| 5. ආලෝක කිරීම් ... ... ... | 1,000 | 0 |
| **ඩී.—මහජන සෞඛ්‍ය :** | | |
| 2. කුණු කසළ ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 1,200 | 0 |
| 3. වැසිකිලි පවිත්‍ර කිරීම්— | | |
| (ඒ) වැටුප් ... ... ... | 9,033 | 0 |
| **ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල :** | | |
| 1. භාරකරුට දීමනා ... ... ... | 1,868 | 0 |
| එකතුව ... | 37,930 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| **ඒ.—පොදු වියදම් :** | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— ජීවනාධාර හා විශේෂ ජීවනාධාර... ... | 10,600 | 0 |
| **සී—නගර හා ඉඩම් ගොඩනැගිලි :** | | |
| 8. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... ... | 1,640 | 0 |
| **ඩී.—මහජන සෞඛ්‍ය :** | | |
| 2. කුණු කසළ ශෝධනය— | | |
| (ඊ) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 5,351 | 0 |
| 3. වැසිකිලි පවිත්‍ර කිරීම— | | |
| (එච්) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 5,930 | 0 |
| 5. ජල සම්පාදනය— | | |
| (ඇෆ්) ණය ... ... ... | 10,867 | 0 |
| (අයි) ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... | 1,540 | 0 |
| **ජේ.—කියම් ශාලා සහ පුස්තකාල :** | | |
| 6. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර ... ... | 2,002 | 0 |
| එකතුව ... | 37,930 | 0 |

## 2 වන කොටස—විදුලි අංශය

| මුදල් ඉතිරි වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| 4. පාලනය සම්බන්ධව සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) වැටුප් හා දීමනා ... ... ... | 4,000 | 0 |
| (බී) වැටුප් එලිමහන් සේවක මණ්ඩලය ... | 8,620 | 0 |
| | 12,620 | 0 |

| මුදල් අවශ්‍ය වැය ශීර්ෂ | මුදල රු. | ශ. |
|---|---|---|
| 10. ජීවනාධාර හා විශේෂ ජීවනාධාර . ... | 12,620 | 0 |
| | 12,620 | 0 |

මෙම මුදල් මාරුව කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමැතියට යටත්ව යොදවා ගැනීමට සභික ජී. ආර්. පොඩිමහත්මයා මහත්මා කරණ ලද යෝජනාව සභික ඇල්. එච්. ආරියදාස මහත්මා විසින් ස්ථිර කරණ ලදුව, ඒකමතිකව සහා සම්මත විය.

ඩී. ඇම්. හේමපාල,
සභාපති,
රුවන්වැල්ල සුළු නගර සභාව.

වර්ෂ 1970ක්වූ අප්‍රියෙල් මස,
රුවන්වැල්ල සුළු නගර සභා කායර්‍යාලයේදීය.

අනුමත කරන ලදී.

පළාත් පාලන සහකාර කොමසාරිස්, කෑගල්ල.

1970ක්වූ අප්‍රියෙල් මස 27 දින,
කෑගල්ලේදී.

5–197—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (ii) දරණ කොටස යටතේ අයදුම් පත

### 1970 අය-වැය ලේඛනය

1970 අය–වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරණ ලද මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර, අවශ්‍යවී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 අප්‍රියෙල් මස 29 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 12 දරණ සම්මුතියෙන් සහා සම්මත විය.

### I වැනි කොටස—සාමාන්‍ය

| ඉතිරි මුදල් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම : | | |
| 1. සේවකයන්ගේ වැටුප්— ... | | |
| (ජී) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 11,865 | 0 |
| (එච්) පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමිකයින්ට අතුරු දීමනා ගෙවීම ... ... | 2,784 | 0 |
| බී.—මහා මාර්ග : | | |
| 13. ජීවන හා විශේෂ ජීවනආධාර ... ... | 1,392 | 0 |
| 14. පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමිකයින්ට අතුරු දීමනා ගෙවීම ... ... | 420 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි : | | |
| 7. අළුත් කර්මාන්ත ... ... | 10,330 | 0 |
| 8. ජීවන හා විශෙෂ ආධාර ... ... | 1,506 | 0 |
| 9. පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමිකයින්ට අතුරු දීමනා ගෙවීම ... ... | 546 | 0 |
| ඩී.—සනීපාරක්ෂාව : | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඔ) ජීවන හා විශෙෂ ජීවන ආධාර ... ... | 2,385 | 0 |
| (පී) පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමකයින්ට අතුරු දීමනා ගෙවීම ... ... | 780 | 0 |
| 2. කසළ ශෝධනය— | | |
| (ඊ) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 6,810 | 0 |
| (ඇෆ්) පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමකයින්ට අතුරු දීමනා ගෙවීම ... | 3,290 | 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | |
| (එච්) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 3,892 | 0 |
| (අයි) පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමකයින්ට අතුරු දීමනා ගෙවීම ... | 1,890 | 0 |
| | 47,890 | 0 |

| වැඩිපුර වියදම් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම : | | |
| 1. සේවකයන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 2,584 | 0 |
| (බී) ලිපිකරුවන් ... ... | 7,050 | 0 |
| (සී) ආදයම් පරීක්ෂක ... ... | 2,320 | 0 |
| (ඩී) පියන්වරු/කායර්‍යාල කායර්‍ය සහායක ... | 1,600 | 0 |
| (ඇෆ්) විශ්‍රාම වැටුප් ... ... | 840 | 0 |
| 2. කායර්‍ය මණ්ඩලයේ වියදම්— | | |
| (එල්) විවාහක දීමනා ... ... | 2,550 | 0 |
| බී.—මහා මාර්ග : | | |
| 1. වේතන හා දෛනික වැටුප්— | | |
| (බී) ඕවර්සියර්වරුන්ට ... ... | 1,796 | 0 |
| (ඩී) විවාහක දීමනා ... ... | 150 | 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි : | | |
| 1. වේතන ... ... ... | 3,430 | 0 |
| 10. විවාහක දීමනා ... ... ... | 120 | 0 |
| ඩී.—සනීපාරක්ෂාව : | | |
| 1. සාමාන්‍ය— | | |
| (ඒ) වේතන— | | |
| (1) සෞඛ්‍ය පරීක්ෂක ... ... | 3,900 | 0 |
| (4) විවාහක දීමනා ... ... | 270 | 0 |
| 2. කසළ ශෝධනය— | | |
| (ඒ) වේතන ... ... ... | 10,440 | 0 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | | |
| (ඒ) වේතන ... ... ... | 10,840 | 0 |
| | 47,890 | 0 |

### II වැනි කොටස—විදුලි අංශය

| ඉතිරි මුදල් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| 2. ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම : | | |
| (සී) මාපක යන්ත්‍ර ඇණ හා අනෙක් උපකරණ ... | 400 | 0 |
| 3. සේවය හා නිවාසයනට විදුලි කම්බි සම්බන්ධ කිරීම : | | |
| (ඒ) උපකරණ ... ... ... | 1,000 | 0 |
| 10. ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 5,455 | 0 |
| 11. පළාත් පාලන සේවකයින්ට හා පළාත් පාලන විශ්‍රාමිකයින්ට අතුරු දීමනා ගෙවීම ... ... | 2,170 | 0 |
| | 9,025 | 0 |

| වැඩිපුර වියදම් වැය ශීර්ෂ | රු. | ශ. |
|---|---|---|
| 4. පාලන හා සාමාන්‍ය වියදම් : | | |
| (ඒ) පරිපාලන වේතන හා ආධාර ... ... | 2,300 | 0 |
| (බී) සංචාරක සේවක වේතන හා ආධාර ... | 6,375 | 0 |
| (ඊ) විවාහ දීමනා ... ... ... | 350 | 0 |
| | 9,025 | 0 |

1970ක්වූ අප්‍රියෙල් මස 29 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කායර්‍යාලයේදීය.

පී. පලනිසාමි,
සභාපති,
සුළු නගර සභාව, පුස්සැල්ලාව.

5–366—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

### 1970 වර්ෂයේ තුන්වන පරිපූරක අයවැය ලේඛනය

| වැය ශීර්ෂය | ගණන රු. ශ. | යෝජනා අංකය සහ දිනය |
|---|---|---|
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| (7) අළුත් වැඩ ... ... | 1,000 0 | 1970.3.25 දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 2 (1) (ආ) දරන සභා සම්මතය. |
| එකතුව | 1,000 0 | |

වර්ෂ 1970ක්වූ මාර්තු මස 25 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 2 (1) (ආ) දරණ සභා සම්මතයෙන් ඒකමතිකව සභා සම්මත වී තිබේ.

ආනන්ද සෝමවීර,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්‍යාලය,
අවිස්සාවේල්ල, 1970.5.3

5—365—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනත (261 වෙනි අධිකාරය)

පළාත් පාලන ආයතන පොදු අතුරු ව්‍යවස්ථා පනතේ 3 වෙනි වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩුබද්දාව ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පලකර සිටිනු ලැබේ.

### යෝජනාව

" පළාත් පාලන ඇමතිතුමා විසින් සම්මත කරනු ලැබ, 1953 අප්‍රේල් මස 10 දින අංක 10,517 දරන ගැසට් පත්‍රයේ පලකරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනලද බව 1953 අගෝස්තු මස 7 දින අංක 10,560 දරන ගැසට්පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල අංක 1-37 දක්වා වූ කාණ්ඩද, 1963 ජූනි මස 21 දින අංක 13,679 දරන ගැසට් පත්‍රයේ පලවූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1965 ජනවාරි මස 8 දින අංක 14,287 දරන ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පමුණුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ අංක 38 දරන කාණ්ඩයද, 1966 ජූලි මස 8 දින අංක 14,703 දරන ගැසට්පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරනු ලැබ, 1969 ජනවාරි මස 3 දින අංක 14,835 දරන ගැසට්පත්‍රයේ ප්‍රකාශයට පමුනුවනු ලැබුවාවූද, එකී අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 හා 41 වන කාණ්ඩද, මෙම යෝජනාව ගැසට්පත්‍රයේ පළවූ දිනසිට ක්‍රියාත්මක වන අන්දමින් සම්මත කර ගැනීමට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ උඩබද්දාව ගම්සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරය) 3 වෙනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් යෝජනාකර සිටිනු ලැබේ "

ජේ. එච්. ටිකිරිබණ්ඩා,
උඩුබද්දව ගම්සභාවේ සභාපති.

1970 අප්‍රේල් මස 18 දින,
උඩුබද්දුව ගම්සභා කාර්යාලයේදීය.

5—359—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ බලල්ල ගම් සභාව

### ගෝඝාතක ආඥපනත

මෙහි පහත දක්වෙන උපලෙඛනයේ සඳහන් අය විසින් 1970 වර්ෂයට මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරිම ගැන බලල්ල ගම් ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇ එසේ විරුද්ධවීමට හේතු දක්වා පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වන අධිකාරය) 7 (2) (ආ) වෙනි වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| අංකය | ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | වෙළඳාම |
|---|---|---|---|
| 1. | ඇම්. සාහුල් හමීඩ්, | ... නාගොල්ලාගම ... | හරක් මස් |
| 2. | පී. ඒ. දෙන් ජුවන් අප්පුහාමි | ... නාගොල්ලාගම ... | හරක් මස් |

ඩබ්ලිව්. ඇම්. හේරත්බණ්ඩා,
සභාපති තැන,
බලල්ල ගම් සභාව.

බලල්ල ගම් සභා කාර්යාලය,
බලල්ල, 1970.5.2

5—360—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ (3) වැනි වගන්තිය යටතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ දැදිගම ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තිය ප්‍රකාර මෙයින් පල කරනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලැබ 1966 ජූලි මස 8 වෙනි දින අංක 14,703 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වෙනි දින අංක 14,835 දරන ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා මාලාවේ 39, 40 හා 41 වෙනි කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ සිට සම්මත කර ගැනීමට දැදිගම ගම්සභාව විසින් 261 වන අධිකාරය වන පළාත් පාලන ආයතන පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කරනු ලැබේ.

ආර්. ඩබ්ලිව්. ඇම්. පොඩිබණ්ඩාර,
දැදිගම ගම්සභාවේ සභාපති.

1970 මැයි මස 2 වැනි දින,
දැදිගම—තුංතොට,
දැදිගම ගම්සභා කාර්‍යාලයයේ දීය.

5—201—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

## පස්සර සුළු නගර සභාව

**1970 වර්ෂයේ වරිපනම් ලේඛන**

1970 වර්ෂය සඳහා මෙම නගරසභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛණ කාර්යාල වේලාවන් හිදී මෙම නගර සභා කාර්යාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරය වූ සුළු නගරසභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥාපණතේ 235(1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඇම්. එච්. ඇම්. රෂීම්,
සභාපති,
පස්සර සුළුනගර සභාව.

1970 මැයි මස 4 දින,
පස්සර සුළු නගරසභා කාර්යාලයේදීය.

5—361—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

---

## නාරම්මල ගම්සභාව

**ගම්සභා ආඥාපනත (257 වෙනි පරිච්ඡේදය)**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව විසින්, 1969 නොවැම්බර් මස 11 වෙනි දින පැවැත් වූ මාසික රැස්වීමේදී ඒකමතිකව සම්මතකර ගන්නා ලද මෙහි පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැන ගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. මෙහි දක්වා ඇති උපලේඛණයෙහි සඳහන් පාරවල් සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසී ජනතාව විරුද්ධවන්නේ නම්, එසේ විරුද්ධවන්නේ අසවල් කරුණු නිසායයි දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මෙකී කාලය තුලදී යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවූවොත්, ඉන්පසු එම පාරවල් ගම්සභාව සතු දේපලක් හැටියට සලකා පාලනය කරනු ලබන බවත්, මෙයින් දැනුම්දෙනු ලැබේ

ඒ. ජී. සී. දයානන්ද පතිරණ,
නාරම්මල ගම් සභාවේ සභාපතිතැන.

1970.5.2 වෙනි දින,
නාරම්මල ගම්සභා කායාීලයේදීය.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරී පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපනතේ 3 වැනි වගන්තියේ 1 වෙනි උප වගන්තිය යටතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නාරම්මල ගම්සභාව විසින් 1959 අගෝස්තු මස 28 වෙනි දින අංක 11,841 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද යෝජනාවෙන් සම්මත වූ පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වෙනි කාණ්ඩයේ 1 වෙනි අතුරුව්‍යවස්ථාවල ප්‍රකාර, 1962.9.7 වෙනි දින අංක 13,293 දරණ ගැසට් පත්‍රය, 67.3.31 වෙනි දින අංක 14,742 දරණ ගැසට් පත්‍රය, 68.5.24 වෙනි දින අංක 14,803 දරණ ගැසට් පත්‍රය, 69.6.20 වෙනි දින අංක 14,859 දරණ ගැසට් පත්‍රය සහ 69.8.22 වෙනි දින අංක 14,868 දරණ ගැසට් පත්‍රය යන ගැසට් පත්‍රවල පල කර ඇති, මංමාවත් වලට වැඩිමනත්ව, මෙහි පහත දැක්වෙන මාවත් එහි දක්වා ඇති දිග හා පළල ඇතිව සාදා හෝ නැවත සාදා හෝ පවත්වාගෙන යායුතුයයි ද, එම කාණ්ඩයේ 6 වෙනි කොටසේ ප්‍රකාර නාරම්මල ගම්සභාවේ සභාපතිතුමාගෙන් ලියවිලි සහිත බලයක් හෝ අවසරයක් නොමැතිව පහත දැක්වෙන උපලේඛණයෙහි දැක්වෙන මාවත්වල ලොරි සහ ටොන් එකහමාරකට වඩා බර ඇති වෙනත් ඕනෑම වර්ගයක වාහනයක් ධාවනය කිරීම හා අලි ඇතුන් ලවා ගල් හෝ ලී කොටන් හෝ ඇද්දවීම නීතිවිරෝධී බව 1969 නොවැම්බර් මස 11 වෙනි දින පවත්වන ලද මෙම ගම්සභාවේ මාසික රැස්වීමේදී ගනේගොඩ සහ කිවුල්ගල්ල ගම්සභා නියෝජිත මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් පසු ඒකමතිකව සභාසම්මත වූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛණය

1. බැදිගමුව-කෝට්ටපිටිය පාසැල් පාරේ, බැදිගමුව කරදගහමුල සිට නල්ලේනේගෙදර හරහා රණාවත්ත දක්වා වූ පාර.

දිග දම්වැල් 28 යි, අඩි 25 යි. පළල අඩි 14 යි.

**වමට මායිම් :**

මතවරාලගේ ලියද්ද, ටී. ඇම්. උක්කුබන්ඩා.
හල්ගහමූල ඉඩම, ඇල්. පුංචිබන්ඩා.
හල්ගහමූල ඉඩම, කේ. ඇම්. කළුබන්ඩා.
ඉන්නාවත්ත, ආර්. ඇම්. බන්ඩා.
ඉන්නාවත්ත, ආර්. ඇම්. රංමැනිකා.
පාලුවත්ත, ආර්. ඇම්. අප්පුහාමි.
ඉන්නාවත්ත, ආර්. ඇම්. පිංහාමි.
හිටිනාවත්ත, කේ. ඇම්. උක්කුරාල.
අලවතුපිටියවත්ත, ආර්. ඇම්. බන්ඩප්පු.
පිංවත්ත, වදාවේ පඤ්ඤානන්ද හිමි.

**දකුණට මායිම් :**

ගෝනිකුඹුර, ටී. ඇම්. උක්කුබන්ඩා. ,
හල්ගහමූල ඉඩම, කේ. ඇම්. මුදියන්සේ.
හල්ගහමූලඉඩම, කේ. ඇම්. කළුබන්ඩා.
හල්ගහමූලකුඹුර, ආර්. ඇම්.. බන්ඩප්පු.,
අඹගහමූල ඉඩම, කේ. ඇම්. මැණික්රාල.
උයන්වත්තකුඹුර, කේ. ඇම්. මැණික්රාල.
දොරකඩකුඹුර, ආර්. ඇම්. පිංහාමි.
යක්කාවිටකුඹුර, කේ. ඇම්. උක්කුරාල.
පිංකුඹුර, වදාවේ පඤ්ඤානන්ද හිමි.
මුල්ලකුඹුර, ඇල්. ඩිංගිරිබන්ඩා.
රජය සතු වැවේ ඉඩම.

2. කිවුල්ගල්ල-ගොඩාකුරුව හරහා විල්ගමුව දක්වා ඇති පාර.

දිග දම්වැල් 2 යි අඩි 5 යි. පළල අඩි 16 යි.

**වමට මායිම් :**

මඩවල හේන, එච්. ඇම්. පුංචප්පුහාමි.

**දකුණට මායිම් :**

කටහේන, එච්. ඇම්. සෝමරත්න.

5—367—70.5.15 දින අංක 14,906 දරන ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ලවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුයි.

## උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මාර්තු ... | 70. 3. 5 බ්‍රහස්පතින්දා .. | 70. 2.27 සිකුරාදා | දහවල් 12.0 |
| | 70. 3.13 සිකුරාදා ... | 70. 3. 5 බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 70. 3.20 සිකුරාදා ... | 70. 3.13 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 3.26 බ්‍රහස්පතින්දා ... | 70. 3.19 බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| අප්‍රේල් ... | 70. 4. 3 සිකුරාදා ... | 70. 3.25 බදාදා | ප.ව. 3.30 |
| | 70. 4.10 සිකුරාදා ... | 70. 4. 3 සිකුරාදා | ප.ව 3.30 |
| | 70. 4.17 සිකුරාදා ... | 70. 4. 8 බදාදා | ප.ව. 3.30 |
| | 70. 4.24 සිකුරාදා ... | 70. 4.17 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 4.30 බ්‍රහස්පතින්දා ... | 70. 4.23 බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| මැයි ... | 70. 5. 8 සිකුරාදා ... | 70. 4.30 බ්‍රහස්පතින්දා | ප.ව. 3.30 |
| | 70. 5.15 සිකුරාදා ... | 70. 5. 8 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 5.22 සිකුරාදා ... | 70. 5.15 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 5.29 සිකුරාදා ... | 70. 5.22 සිකුරාදා | ප.ව. 3.30 |
| ජූනි ... | 70. 6. 5 සිකුරාදා ... | 70. 5.29 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 6.11 බ්‍රහස්පතින්දා ... | 70. 6. 5 සිකුරාදා | ප.ව. 3.30 |
| | 70. 6.18 බ්‍රහස්පතින්දා ... | 70. 6.11 බ්‍රහස්පතින්දා | දහවල් 12.0 |
| | 70. 6.25 බ්‍රහස්පතින්දා ... | 70. 6.18 බ්‍රහස්පතින්දා | දහවල් 12.0 |

1970 මාර්තු මස 5 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.